18

හදීස් කලාවේ ඉමාම්වරු
කොටස -I

නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාගේ වචන, ක්‍රියාව, අනුමැතිය, එතුමාගේ ගතිගුණ, ශරීර ලක්ෂණ යනාදිය හදීස් යනුවෙන් හඳුන්වනු ලබයි.

අල්කුර්ආනය පහළ කරන ලද අවස්ථාවේ දී "**කුත්තාබුල් වහී**" යනුවෙන් හඳුන්වනු ලැබූවන් ඒවා සටහන් කර ආරක්ෂා කරන සේවයෙහි නිරත වූහ. එහෙත් ඔවුහු හදීස් සටහන් කිරීමට නිල වශයෙන් උත්සාහ නොකළහ. අල්කුර්ආනයට ප්‍රමුඛස්ථානය ලබා දීම, හදීස් සමඟ අල්කුර්ආනය මිශ්‍ර වේ ය, යන බිය, සාක්ෂරතාව ඇත්තවුන්ගේ හිඟය, යනාදිය හදීස් සටහන් කර ආරක්ෂා නොකිරීමට හේතු විය.

එහෙත් හදීස් කලාවේ නබි අනුගාමිකයෝ තම සීමා රහිත මතක ශක්තිය මඟින් ද ඒවා දෛනික ජීවිතයේ දී ක්‍රියාවට නැංවීම මඟින් ද, තම මිතුරන් සමඟ තමන් දැන සිටි දේ හුවමාරු කර ගැනීම මඟින් ද, තම ඊළඟ පරම්පරාව වූ තාබිඊන්වරුන්ට ඉගැන්වීම මඟින් ද හදීස් ආරක්ෂා කළහ.

මේ සමඟ සහාබාවරුන් කිහිප දෙනෙකු විසින් නිල නොවන ආකාරයෙන් හදීස් ලිඛිතව තබා ගත් බව ද අවධානයට ලක් කළ හැකි ය.

හදීස් කලාව ආරක්ෂා කිරීමේ සේවයෙහි ලා ඒවා දස අත සොයා සටහන් කිරීමේ කාර්යය, තාබිඊන්වරුන්ගේ කාලයේ දී සිදු විය. කලීෆා උමර් ඉබ්නු අබ්දුල් අසීස් රහ්මතුල්ලාහි අලෛහි තුමා තම රාජ්‍ය පාලන කාලයේ දී ආණ්ඩුකාරවරුන්ට හා ඉමාම්වරුන්ට ලිපි ලියා, හදීස් එක්රැස් කිරීමේ සේවය දිරි ගැන්වී ය. මෙහි ප්‍රතිඵලයක් ලෙස හදීස් කලාව තුල ග්‍රන්ථ රැසක් බිහි විය.

ඊළඟ පරම්පරාව වූ තබඋත් තාබිඊන්වරුන්ගේ කාල පරිච්ඡේද සේ මෙම හදීස් කලාව උච්චස්ථානයතෙක් වර්ධනය විය. තාබිඊන්වරුන්ගෙන් හදීස් ඉගෙන ගත් හදීස් කලාවේ විද්වත්හු මෙම ක්ෂේත්‍රයට මහත් සහයක් ලබා දුන්හ.

මෙම කාල පරිච්ඡේදය තුළ දී මුස්නද්, මුසන්නෆ්, ජාමිඋ යනුවෙන් හදීස් ග්‍රන්ථ රැසක් බිහි විය.

මේ අතර **"සිහාහුස් සිත්තා"** යන ප්‍රධාන හදීස් ග්‍රන්ථ හය ප්‍රසිද්ධ ග්‍රන්ථ වේ. මේ අනුව මෙම ග්‍රන්ථ ගොනු කළ ඉමාම්වරුන් පිළිබඳ දැන ගැනීම වැදගත් වේ.

1. ඉමාම් බුහාරි රහ්මතුල්ලාහි අලෛහි තුමා (හිජ්රි 194 - 256)

හිජ්රි 194 දී උපත ලත් මෙතුමාගේ සම්පූර්ණ නාමය අබූ අබ්දිල්ලාහ් මුහම්මද් ඉස්මායීල් අල් බුහාරි වේ. උස්බෙකිස්තානයේ බුහාරි නම් නගරයේ උපත ලැබූ නිසා මෙතුමා ඉමාම් බුහාරි යනුවෙන් හඳුන්වනු ලැබේ. තරුණ වියේ දී පියා අහිමි වූ මෙතුමා කුඩා කාලයේ දී ම අල්කුර්ආනය හා හදීස් රැසක් කටපාඩම් කර ගත්තේ ය. හදීස් කලාව පිළිබඳ ව අසීමිත උනන්දුවක් දැක්වූ ඉමාම් තුමා හදීස් කටපාඩම් කරන අතරතුර හදීස් දන්වන්නන්ගේ ජීවිතය පිළිබඳව ද දැන ගැනීමට අවධානය යොමු කළේ ය. ඥානය හා අසීමිත මතක ශක්තිය ඇති මොහු හදීස් සටහන් කිරීමේ දී ඉතා ම සුපරීක්ෂාකාරී වූයේ ය.



වයස අවු. 16 දී ප්‍රථම වරට හජ් ඉටු කිරීමට ගිය ඉමාම් තුමා මක්කාවේ නතර වී ඒ අවට සිටි මුහද්දිස්වරුන්ගෙන් හදීස් ඉගෙන ගැනීම ආරම්භ කළේ ය. තව ද, එතුමා ප්‍රදේශ රැසකට ගමන් කර හදීස් ඉගෙන ගත්තේ ය.

සහීහ් වන හදීස් පමණක් අන්තර්ගත කර හදීස් ග්‍රන්ථයක් ගොනු කිරීමට මොහු ආශාවෙන් සිටියේ ය. ඉමාම් තුමාගේ උනන්දුව අවධාරණය කළ මෙතුමාගේ ගුරුතුමා වූ ඉමාම් ඉස්හාක් ඉබ්නු රාහවයි හි තුමා එය තවත් උනන්දු කළේ ය. එහි ප්‍රතිඵලයක් ලෙස සහීහුල් බුහාරි එළි දක්වනු ලැබිණි. එය ගොනු කිරීමට ඉමාම් තුමා වසර 16ක් වෙහෙස විය. එතුමා තමන්ට ලැබුණු ලක්ෂ 6ක පමණ හදීස් අතරින් ගවේෂණය කොට හදීස් 7275ක් බුහාරි ග්‍රන්ථයේ සටහන් කළේ ය.

අල්කුර්ආනයට පසුව ඊළඟ තත්ත්වයෙහි ලා සාධක සහිත මූලාශ්‍රය ලෙස සලකනු ලබන මෙම ග්‍රන්ථයට අර්ථකතන රැසක් ලියන ලදී. ඒවා අතරින් ඉමාම් ඉබ්නු හජර් අස්කලානි රහ්මතුල්ලාහි අලෛහි තුමා රචිත **"ෆත්හුල් බාරි"** නම් ග්‍රන්ථය විශේෂිත වේ.

ඉමාම් බුහාරි තුමා හිජ්රි 256 දී සමර්කන්ද් හි වෆාත් වූයේ ය.

2. ඉමාම් මුස්ලිම් රහ්මතුල්ලාහි අලෛහි තුමා (හිජ්රි 204 -. 261)

හිජ්රි 204 දී නයිසාපූර්හි කුශෛර් නම් ප්‍රදේශයේ උපත ලත් මෙතුමාගේ සැබෑ නාමය වනුයේ අබුල් හසන් මුස්ලිම් ඉබ්නු හජ්ජාජ් අල් කුශෛරී වේ. ප්‍රාථමික අධ්‍යාපනය නයිසාපූර්හි ලැබුවේ ය. ස්වභාවයෙන් ම අසීමිත මතක ශක්තියක් ද හදීස් එක්රැස් කිරීමෙහි ලා උනන්දුවක් ද දැක්වූ ඉමාම් මුස්ලිම් හදීස් ගොනු කර ගැනීමේ අභිලාෂයෙන් ඉමාම් බුහාරි තුමා සේ රටවල් රැසකට ගමන් කළේ ය. මෙතුමා ගොනු කළ හදීස් ගොනුව “සහීහුල් බුහාරි” ග්‍රන්ථයට පසුව ඊළඟ ස්ථානයෙහි ලා සලකනු ලබයි.

ඉමාම් මුස්ලිම් තුමා තමන් එක් රැස් කළ ලක්ෂ 3ක් පමණ වූ හදීස් අතරින් 7000ක් තෝරා ඒ අතරින් හදීස් 4000ක් අන්තර්ගත කර “සහීහුල් මුස්ලිම්” නම් ග්‍රන්ථය ගොනු කළේ ය.

මෙම ග්‍රන්ථයට අර්ථවිවරණ රැසක් ලියන ලදී. ඒ අතරින් ඉමාම් නවවි රහ්මතුල්ලාහි අලෛහි තුමා විසින් රචිත “අල් මින්හාජ්” නම් ග්‍රන්ථය ඉතා ප්‍රසිද්ධ ය.

ඉමාම් මුස්ලිම් රහ්මතුල්ලාහි අලෛහි තුමා හිජ්රි 261 දී නයිසාපූර්හි වෆාත් වූයේ ය.

ඉමාම් බුහාරි රහ්මතුල්ලාහි අලෛහි තුමා ඉමාම් මුස්ලිම් රහ්මතුල්ලාහි අලෛහි තුමා යන අය හා ඔවුන්ගේ ග්‍රන්ථ හදීස් කලාවේ විද්වතුන් අතර ''**සහීහෛන්**'' යනුවෙන් ද මෙම ග්‍රන්ථ දෙකෙහි ම එක සමානව සටහන් කරන ලද හදීස් ''**මුත්තෆකුන් අලෛහි**'' යනුවෙන් ද හඳුන්වනු ලබයි.

අභ්‍යාසය

1. නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාගේ හා සහාබාවරුන්ගේ කාලය අතරතුර හදීස් ගොනු නොකිරීමට හේතු මොනවා ද?
2. හදීස් කලාවට ඉමාම් බුහාරි තුමා සිදු කළ සේවාව කුමක් ද?
3. තබඋත්තාබිඊන්වරුන්ගේ කාල සීමාව තුළ දී බිහි වූ හදීස් ග්‍රන්ථ දෙවර්ගය මොනවා ද?
4. සහීහුල් බුහාරි හි අර්ථ විවරණ ග්‍රන්ථයක් සඳහන් කරන්න.
5. සහීහුල් මුස්ලිම් අර්ථ විවරණය වූ අල් මින්හාජ් නම් ග්‍රන්ථයේ කර්තෘ කවුද?
6. නිල වශයෙන් හදීස් ගොනු කිරීමට අනුග්‍රහය ලබා දුන් කලීෆාවරයා කවුද?

කොටස - II

පෙර පාඩම තුළින් හදීස් කලාවේ ඉමාම්වරුන් අතරින් දෙදෙනකුගේ ජීවන කතා හා ඔවුන්ගේ ග්‍රන්ථ පිළිබඳව අවධානය යොමු කළෙමු. මෙහි දී අනෙකුත් ඉමාම්වරුන් සිව්දෙනාගේ ජීවන කථා හා ඔවුන් ගොනු කළ ග්‍රන්ථ පිළිබඳව ද අවධානය යොමු කරමු.



ඉමාම් අබූදාවූද් රහ්මතුල්ලාහි අලෛහි තුමා (හිජ්රි 201 . 275)

අබූදාවූද් සුලෛමාන් ඉබ්නු අෂ්අස් අස්සිජිස්තානි යන්න මෙතුමාගේ සම්පූර්ණ නාමය වේ. හිජ්රි 202 දී සිජිස්තාන් නම් නගරයේ දී උපත ලත් මෙතුමා තම ප්‍රාථමික අධ්‍යාපනය නයිසාපූර්හි දී හා පසුව කුරාසාන්, ඊජිප්තුව, සිරියා, හිජාස් ප්‍රමුඛ නගරවල දී ද්විතීයික අධ්‍යාපනය ද ලැබුවේ ය. හදීස් එක් රැස් කර ගැනීම සඳහා නගර රැසකට පිය නැගුවේ ය.

මොහු අතිශය මතක ශක්තියකින් හෙබි පුද්ගලයෙක් වූ අතර දේව භක්තිය, පරිත්‍යාගශීලීභාවය, දානශීලීත්වය වැනි යහගුණාංගවල උල්පත ද විය.

ඉමාම් තුමා තමා විසින් ම සොයා ගන්නා ලද හදීස් ලක්ෂ 5 අතුරින් හදීස් 4800ක් තෝරා ගෙන වසර 20ක පමණ කාලයක් තුළ වෙහෙස වී "සුනන් අබූදාවූද්" නම් ග්‍රන්ථය ගොනු කළේ ය. ඉමාම් අබූදාවූද් රහ්මතුල්ලාහි අලෛහි තුමාණෝ හිජ්රි 275 දී බසරාවේ දී වෆාත් වූහ.

ඉමාම් තිර්මිදි රහ්මතුල්ලාහි අලෛහි තුමා (හිජ්රි 209 - 279)

ඉමාම් අබූ මූසා මුහම්මද් ඉබ්නු ඊසා අත්තිර්මිදි හිජ්රි 209 දී කුරාසාන් ප්‍රාන්ථයේ තිර්මිදි නම් නගරයේ දී උපත ලැබුවේ ය. ප්‍රාථමික අධ්‍යාපනය කුරාසාන්හි දී ලැබූ මොහු ඉමාම් බුහාරි රහ්මතුල්ලාහි අලෛහි තුමා හා ඉමාම් මුස්ලිම් රහ්මතුල්ලාහි අලෛහි තුමා මෙන් හදීස් කලාවට සේවය කළ යුතු, යැයි අධිෂ්ඨාන කර ගත්තේ ය.



ඉමාම් බුහාරි රහ්මතුල්ලාහි අලෛහි, ඉමාම් මුස්ලිම් රහ්මතුල්ලාහි අලෛහිවැනි අයගෙන් අධ්‍යාපනය ලැබූ මෙතුමා හදීස් එක් රැස් කිරීම සඳහා ප්‍රදේශ රැසකට ගමන් කළේ ය. මෙතුමා දේව භක්තිය හා යහගුණාංවලින් හෙබි පුද්ගලයෙක් විය.

ඉමාම් තිර්මිදි රහිමහුල්ලාහ් තුමා තමන්ට ලැබුණු හදීස් ලක්ෂ ගණනින් හදීස් 4800ක් තෝරා ගොනු කර හදීස් ග්‍රන්ථයක් එළි දැක්වුවේ ය. එය **"ජාමිඋත් තිර්මිදි"** යනුවෙන් හඳුන්වනු ලබයි. එක ම හදීසය නැවත නැවත අන්තර්ගත නොවන අතර හදීසයෙහි අවසානයේ එහි තරාතිරම සඳහන් කර තිබීමත් මෙහි විශේෂත්වයකි. ඉමාම් තිර්මිදි රහ්මතුල්ලාහි අලෛහි තුමා හිජ්රි 279 දී තමන් උපත ලැබූ තිර්මිදි නගරයේ දී වෆාත් වූවේ ය.

ඉමාම් නසාඊ රහ්මතුල්ලාහි අලෛහි තුමා (හිජ්රි 215 - 303)

හිජ්රි 215 දී කුරාසාන් නම් ප්‍රාන්තයේ නසාඊ නම් නගරයේ උපත ලත් මොහුගේ සම්පූර්ණ නාමය වන්නේ, අබූ අබ්දුර් රහ්මාන් අහ්මද් ඉබ්නු ෂුඅයිබ් අන්නසාඊ වේ. හදීස් කලාවේ පෙර සිටි ඉමාම්වරුන් සේ ම ඉමාම් නසාඊ තුමා ද හදීස් කලාව පිළිබඳව දැඩි උනන්දුවක් දැක්වූයේ ය. එවකට හදීස් කලාව තුළ ප්‍රසිද්ධ මුහද්දිස්වරුන් සොයා ප්‍රදේශ රැසකට ගමන් කළේ ය.

මෙවැනි ගමන් මගින් මෙතුමා එක්රැස් කර ගත් හදීස් ලක්ෂ 5 අතරින් හදීස් 4341ක් තෝරා ගෙන හදීස් ග්‍රන්ථයක් හෙළි දැක්වූයේ ය. එය **"සුනන් නසාඊ"** යන නමින් හඳුන්වනු ලැබේ. එතුමා මෙම ග්‍රන්ථය පමණක් නොව තවත් ග්‍රන්ථ රැසක් ද ලීවේ ය.

ඊජිප්තුව අවට ඉගැන්වීම් සිදු කළ ඉමාම් නසාඊ රහ්මතුල්ලාහි අලෛහි තුමා තබරානි, තහාවී වැනි ඉමාම්වරුන්ගේ ගුරුතුමා වේ. මෙතුමා හිජ්රි 303 දී මක්කාවේ දී වෆාත් වූයේ ය.

ඉමාම් ඉබ්නු මාජහ් රහ්මතුල්ලාහි අලෛහි තුමා (හිජ්රි 209 . 273)



හිජ්රි 209 දී කස්වීන් නගරයේ දී උපත ලත් ඉමාම් ඉබ්නු මාජහ් රහ්මතුල්ලාහි අලෛහි තුමාගේ සම්පූර්ණ නම වන්නේ, අබූ අබ්දිල්ලාහ් මුහම්මද් ඉබ්නු යසීද් අල් කස්වීනි වේ. හදීස් කලාවේ ප්‍රශංසනීය කාල පරිච්ඡේදය තුළ ජීවත් වූ මෙතුමාට හදීස් කලාවේ අනෙකුත් ඉමාම්වරුන් සේ ම තමන් ද නිපුණත්වයක් ලබා ගත යුතු යැයි උනන්දුවක් ඇති විය. මෙය හේතු කොට ගෙන තමන් උපන් නගරයේ ම ප්‍රාථමික අධ්‍යාපනය ලබා, පසුව කුරාසාන්, ඉරාකය, හිජාස්, සිරියාව, ඊජිප්තුව ප්‍රමුඛ හදීස් කලාවට ප්‍රසිද්ධියක් දැරූ නගරවලට ගොස් හදීස් කලාව අධ්‍යයනය කළේ ය. අබූබක්ර් ඉබ්නු අබී ෂෛබා රහ්මතුල්ලාහි අලෛහි තුමා, ඉබ්රාහීම් ඉබ්නු මුන්සිර් රහ්මතුල්ලාහි අලෛහි තුමා වැනි ඉමාම්වරු මෙතුමාගේ ගුරුවරු වූහ.

මොහු විසින් ගොනු කරන ලද සුනන් ඉබ්නු මාජාහ් ග්‍රන්ථය සිහාහුස් සිත්තාවෙහි එකක් වේ. ඉමාම් තුමා තමාට ලැබුණු 40000ක් පමණ හදීස් අතරින් හදීස් 4000ක් තෝරා ගෙන මෙම ග්‍රන්ථය ගොනු කළේ ය. මෙතුමාණෝ හිජ්රි 273 දී වෆාත් වූහ.

මෙම සිව්දෙනාගේ ග්‍රන්ථ හදීස් කලාවේ විද්වතුන් විසින් "සුනන් අර්බඅා" යනුවෙන් හඳුන්වනු ලබයි.

නම	උපන් හිජ්රි වසර	හැඳින් වූ නම	පියාගේ නම	උපන් ගම	හදීස් ග්‍රන්ථය	ඇතුළත් හදීස් සංඛ්‍යාව	විපත හිජ්රි වසර
1. මුහම්මද්	194	බුහාරි	ඉස්මායීල්	බුහාරා	සහීහුල් බුහාරි	7275	256
2. මුස්ලිම්	204	මුස්ලිම්	හජ්ජාජ්	නයිසාපූර්	සහීහ් මුස්ලිම්	4000	261
3. මුහම්මද්	209	තිර්මිදි	ඊසා	තිර්මිදි	ජාමිඋත් තිර්මිදි	4800	279
4. සුලයිමාන්	201	අබූදවුද්	අෂ් අස්	සිජිස්ථාන්	සුනන් අබු දවුද්	4800	275
5. අහ්මද්	215	නසාඊ	ෂුඅයිබ්	නසාඊ	සුනන් නසාඊ	4341	303
6. මුහම්මද්	209	ඉබ්නුමාජාහ්	යසීද්	කස්මින්	සුනන් ඉබ්නුමාජාහ්	4000	273

අභ්‍යාස

1. ආරෝපිත නාමයෙන් තොරව තම නියම නාමයෙන් ආමන්ත්‍රණය කරන හදීස් කලාවේ ඉමාම් තුමා කවුරුන් ද?
2. තිර්මිදි ග්‍රන්ථයේ විශේෂත්වය කුමක් ද?
3. ඉමාම් නසාඊ තුමාගේ සිසුහු කවරහු ද?
4. ඉමාම් ඉබ්නු මාජාහ් තුමාගේ ගුරුවරුන් දෙදෙනෙකුගේ නම් ලියන්න.
5. සුනන් අර්බඅා හි අන්තර්ගත ග්‍රන්ථ මොනවා ද?